**මහාචාර්ය සී දහනායක මැතිතුමා**

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පුරෝගාමී පීඨාධිපතිවරයා වූ ද, භෞතික විද්‍යා අංශයේ පුරෝගාමී අංශාධිපතිවරයා වූ ද, භෞතික විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය චාල්ස් දහනායක මහතා අවුරුදු 81 ක් ආයු වළඳා 2009 පෙබරවාරි 14 වැනි දින අභාවප්‍රාප්ත විය.

මා හට ඔහු ප්‍රථම වරට හඳුනා ගැනීමට ලැබෙනුයේ මෙයට අවුරුදු 30 කට පෙර ආධුනික සහකාර කථිකාචාර්ය වරයකු වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයට සම්බන්ධ වූ දිනයේ දී ය . එතැන් සිට ඔහු ඉතා කාරුණික හදවතක් ඇති සුවිශේෂී පුද්ගලයකු ලෙස හඳුනා ගත්තෙමි. සෑම විට ම තමාගේ සහාය බලාපොරොත්තු වන්නන් හට හැකි උපරිමයෙන් උදව් කිරීම ඔහු සතු සුවිශේෂ ගුණාංගයක් විය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම නියම මහත්මා ගුණ ඇත්තෙකු වූ ඔහු නිහතමානී ඉතා සරල පුද්ගලයකු විය. ඔහුගේ සරල බව ඔහුගේ ඇඳුමින් ද, ජීවන රටාවෙන් හා ඔහු කළ කී සෑම දෙයින් ම මනාව පිළිබිඹු විය. අවස්ථාවෝචිතව කටයුතු කිරීමේ අපූර්ව හැකියාවකින් යුතු ඔහු කිසිදු අවස්ථාවක ඔහුගේ සාර්ථකත්වය ගැන උදම් ඇනුවේ නැත. එසේ කළේ නම් ඒ අනාගත පරපුරේ සුභසිද්ධිය සඳහා ය. එතුමා සහෘදයන්ගේ පමණක් නොව විද්‍යා පීඨයේ සියලු දෙනාගේත්, කැලණිය විශ්වවිද්‍යාලයේත් ගෞරවාදර පිළිගැනීමට ලක්විය.

මහාචාර්ය සී. දහනායක මහතා 1928 පෙබරවාරි 8 වැනිදා ගාල්ලේ හියාරේ ප්‍රදේශයේදී උපත ලැබීය. තම ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔහු මූලික සහතික පත්‍ර විභාගයෙන් පසු ගාල්ල විද්‍යාලෝක විද්‍යාලයට ඇතුළු විය. එහිදී 1944 දී කනිෂ්ඨ සහතික පත්‍ර විභාගයට ඉංග්‍රීසි භාෂාවෙන් පෙනී සිටි ඔහු 1945 දී කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළු වනුයේ විද්‍යාව හැදෑරීමේ අරමුණෙනි. එහි දී ඔහු සියලු දෙනා මවිතයට පත් කරනුයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය කලා හා විද්‍යා විෂයයන්ගෙන්ද, “London Matriculation” විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය ඉතා ඉහළින් සමත් වෙමින් හා ගණිතය විෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ ශිෂ්‍යත්වයක් දිනා ගනිමිනි.

මහාචාර්ය සී දහනායක මහතා 1947 වර්ෂයේදී ගණිතය පිළිබඳ විද්‍යාවේදී විශේෂ පාඨමාලාව හැදෑරීම සඳහා ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළු වූයේය. ප්‍රථම වසර අවසානයේ “Framji Kahn” ත්‍යාගය දිනා ගත් ඔහු වසර 3ක දී විද්‍යාවේදී විශේෂ උපාධිය අවසන් කරලීමේ වරප්‍රසාදය හිමි කර ගත්තේය. මේ වන විට භෞතික විද්‍යාව පිළිබඳ වැඩි උනන්දුවක් දැක්වූ ඔහු ගණිත මහාචාර්යවරයා ද කණගාටුවට පත් කරමින් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හැදෑරීමට යොමු විය. ඉන් පසු 1951 වසරේ දී ප්‍රථම පන්තියේ ගෞරව සාමර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය දිනා ගැනීමට සමත් වූයේය.

මහාචාර්ය සී දහනායක මහතා 1951 වර්ෂයේදී ලංකා විශ්වවිද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ සහකාර කථිකාචාර්යවරයකු ලෙස සේවයට එක්වෙමින් තම සාර්ථක වෘත්තීය දිවියට අත් පොත් තැබීය. ඉන්පසු 1953 දී විශ්වවිද්‍යාල සඳහා රජයෙන් පිරිනැමෙන ශිෂ්‍යත්වයක් මත එතුමා සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලයට ඇතුළු විය. එහි දී නොබෙල් ත්‍යාගලාභී මහාචාර්ය සී. එෆ්. පවෙල් මහතා යටතේ අන්තරීක්ෂ කිරණ සම්බන්ධව පර්යේෂණ කළ ඔහු 1956 අප්‍රේල් මස දී අධි ශක්ති අංශු භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හිමිකර ගත්තේය.

ආචාර්ය උපාධිය ලැබූ විගස මහාචාර්ය සී. දහනායක විද්වතාණෝ නැවත ලංකාවට පැමිණ ලංකා විශ්වවිද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ සිය ඉගැන්වීම් සහ පර්යේෂණ කටයුතුවල නිරත වූහ. එහි දී 1956 වර්ෂයේදී පමණ කථිකාචාර්ය (2- ශ්‍රේණිය) ලෙසත්, 1961 දී කථිකාචාර්ය (1- ශ්‍රේණිය) ලෙසත් උසස් වීම් ලැබීය. 1962 වර්ෂයේ දී සප්තවාර්ෂික නිවාඩු ලැබූ එතුමා ප්‍රාථමික අන්තරීක්ෂ කිරණ පිළිබඳව පර්යේෂණ සිදු කිරීම සඳහා Fulbright අධිශිෂ්‍යත්වයක් ලැබ ඇමරිකා එක්සත් ජනපදයේ රොචෙස්ටර් විශ්වවිද්‍යාලයට ඇතුළු විය. ඉන්පසු 1963-1967 කාලය තුළ ඔහු ලංකා විශ්වවිද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් මූලික අංශු පිළිබඳ පර්යේෂණ තවදුරටත් සිදු කළේය.

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ (වත්මන් කැලණිය විශ්වවිද්‍යාලයේ) 1967 දී ආරම්භ කරන ලද විද්‍යා පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ පළමු අංශාධිපති ලෙසත්, භෞතික විද්‍යාව පිළිබඳ පළමු මහාචාර්යවරයා ලෙසත් වැඩ භාරගත් එතුමා විද්‍යා පීඨයේ පළමු පීඨාධිපති ලෙස ද හත් වසරක් එම ධූරයෙහි තම වගකීම් නොපිරිහෙලා ඉටු කළේය. විද්‍යා පීඨය අද පවතින දියුණු තත්වය කරා ගෙන ඒම පිණිස පුරෝගාමී මෙහෙවරක යෙදුණු එතුමා සිදුකල සේවය අද ද සියලු දෙනාගේ ම පැසසුමට ලක්වන්නකි.

මහාචාර්ය දහනායක මහතා ස්වභාෂාවෙන් විද්‍යාව ඉගැන්වීමේ පුරෝගාමියකු විය. ඔහු විසින් සිංහලෙන් රචිත ප්‍රායෝගික භෞතික විද්‍යාව ග්‍රන්ථය අදටත් උසස් පෙළ හා විශ්වවිද්‍යාල ප්‍රථම වසර සිසුන් අතර ඉතා ජනප්‍රිය මෙන් ම බහුලව භාවිත වන කෘතියකි. ඔහු ජේ. කේ. රොබට්සන් මහතාගේ "Optics-Geometrical and Physical" නම් පොත සිංහලට පරිවර්තනය කළ අතර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව මගින් ප්‍රකාශිත භෞතික විද්‍යාව පිළිබඳ පාරිභාෂිත ශබ්ද මාලාව සැකසීමේ කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කළේය. එමෙන් ම සිංහල භාෂාවෙන් පළ වන "විදුර" සගරාවේ සහ ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය මගින් එළිදක්වන "Sri Lankan Journal of Physics" නම් ප්‍රකාශනයෙහි ප්‍රධාන සංස්කාරක ධූරයද එතුමා විසින් උසුලන ලදි. එතුමා උසස් පෙළ භෞතික විද්‍යා ප්‍රශ්නපත්‍රයේ ප්‍රධාන පාලක පරීක්ෂක ලෙස 1971 සිට 1974 දක්වාත්, සම්පාදක ලෙස 1986 සිට 1990 දක්වාත් කටයුතු කර ඇත. එමෙන්

ම 1989 සිට 1991 දක්වා ජාතික අධ්‍යාපන ආයතනයට අනුබද්ධ ව උසස්පෙළ භෞතික විද්‍යාව විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කළේය.

ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය බිහිකිරීමේ දී එතුමා පුරෝගාමී ව කටයුතු කළ අතර එහි පළමු සභාපතිවරයා ද විය. එතුමා ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයෙහි යාවජීව සාමාජිකයෙකු හා ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු (Fellow) ලෙසද, ආරම්භයේ සිට අභාවප්‍රාප්ත වනතුරුම එහි පාලක සභාවේ සාමාජිකයකු ලෙසද අගනා මෙහෙයක් ඉටු කළේය. එමෙන් ම එතුමා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ යාවජීව සාමාජිකයකු ලෙසද, 1974 දී එහි E කොටසේ (භෞතීය විද්‍යා) සභාපති ලෙස ද, 1990 දී එහි ප්‍රධාන සභාපති (General President) ලෙස ද කටයුතු කළේය. ශ්‍රී ලංකා ජාතික විද්‍යා අධ්‍යයන ආයතනයෙහි ආරම්භයේ සිට ම ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ එතුමා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනවලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස සේවය කරන ලදි. තවද එතුමා ශ්‍රී ලංකා ගණිත සහ විද්‍යා අධ්‍යාපනය සඳහා වූ සංගමයෙහි සාමාජිකයකු ලෙස ද උදාර මෙහෙයක් ඉටු කළේය.

මහාචාර්ය සී දහනායක විද්වතාණෝ 1993 ජූලි මස 31 වැනිදා කැලණිය විශ්වවිද්‍යාලයෙන් විශ්‍රාම ලැබූහ. ඉන්පසුවත් ඔහු කොන්ත්‍රාත් පදනම මත 1996 අප්‍රේල් මාසය වන තුරු භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා ලෙස කැලණිය විශ්වවිද්‍යාලයට සිය සේවය ලබාදුන්නේය. ඔහුගේ උදාර සේවය 45 වසරක් පුරාවට විශ්වවිද්‍යාල පද්ධතියට සැලසුනු අතර කැලණිය විශ්වවිද්‍යාලය සඳහා ඔහු වසර 29 ක් සේවය කළේය. ඔහු විසින් භෞතික විද්‍යා විෂය ක්ෂේත්‍රයට, පොදුවේ අධ්‍යාපනයට සහ කැලණිය විශ්වවිද්‍යාලයට සිදුකරන ලද අති මහත් සේවය අගයනු වස් 1997 ජනවාරි මස ඔහු වෙත භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ සම්මානිත මහාචාර්ය ධුරයක් පිරිනමන ලදි. විශ්‍රාම ගැනීමෙන් අනතුරුව වුව ද කැලණිය විශ්වවිද්‍යාලයට, ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය ඇතුළු අනෙකුත් සංගම් වලට ස්වකීය දායකත්වය ලබාදීමට නොපැකිලව එතුමා ඉදිරිපත් වූයේය. අද වන විට ඔහුගේ බුද්ධි මහිමය මෙන් ම නිරහංකාර මන්දස්මිතියද දැයට අහිමිව ඇතත් එතුමා පිලිබඳ මතකය අප සිත් සතන්හි සදා අනුස්මරණීය ලෙස සනිටුහන් වී ඇත.

මහාචාර්ය කේ. ඩී. ජයසූරිය

භෞතික විද්‍යා අධ්‍යයන අංශය

විද්‍යා පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය